ටිබෙට් දේශයෙහි වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය

සඳමාලි උදේශිකා දිසානායක[1]

Abstract

Vajrayana Buddhism is an important evolution within Mahayana Buddhism and constitutes the religio-cultural identity of Tibet. It was founded in the 7th century during the reign of King Songtsen Gampo but flowered during the reign of King Trisong Detsen in the 8th century under the patronage of great Indian scholars and tantric masters. Research Problem: The article explores how Vajrayana Buddhism, a foreign corpus of learning, was preserved, expanded, and adapted to accommodate the cultural contexts of Tibet and to emerge as a unique spiritual tradition of Tibet. Aims and Objectives: In an attempt to understand this intercultural communication that integrated Buddhist prescriptions with autochthonous Tibetan elements, this paper shall strive to analyze the main contributions made by the Indian and Tibetan masters in shaping Tibetan Vajrayana Buddhism. For its research, the study will resort to the use of the historical research method to principal figures such as Shantarakshita, Padmasambhava, Atisha Dipankara, and their contribution to the evolution of Tibetan Buddhism. This relies on primary and secondary sources, which investigate and analyze controversy concerning the processes of cultural transmission and cultural adaptation. The embedded intercultural collaboration that shaped Tibetan Buddhism can be found in the synthesis of Madhyamaka philosophy with Vajrayana practices by Shantarakshita, in the integration of indigenous aspects by Padmasambhava in Tibet, and in the gradualist approach to enlightenment by Kamalashila. Atisha's influence in the 11th century was a purifying agent for Tibetan spiritual practice and had an effect on the development of the Gelug school. Conclusion The development and popularization of Vajrayana Buddhism in Tibet can only be plausible because of the tireless efforts of scholars by way of facilitating the translation, reception and instruction of Vajrayana. This rich spiritual heritage deeply embedded in Tibetan culture only goes to underline the important role of intercultural collaboration in the practice, development and popularization of religious traditions.

Key Words: *Cultral Transmission, Intercural Collaboration, Tantric Buddhism, Tibetan Buddhism, Vajrayana Buddhism*

1 සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.

හැඳින්වීම

බුදුදහමේ ව්‍යාප්තිය හා සංවර්ධනය ලෝක ඉතිහාසය තුළ විශිෂ්ටම ආධ්‍යාත්මික සංස්කෘතික සිදුවීමක් ලෙස හැඳින්විය හැක. එහි විශිෂ්ට ආවර්ජනයක් දක්නට ලැබෙන්නේ ටිබෙටයේ වජ්‍රයාන සම්ප්‍රදාය තුළය. වජ්‍රයාන බුදුදහම, මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි විශේෂ ශාඛාවක් වන අතර, එය උත්කෘෂ්ටතාවය, ස්ථිරභාවය සහ භාවනාව වැනි ගැඹුරු සංකල්පවලින් යුත් මාර්ගයක් ලෙස සැලකේ. ක්‍රි.ව. 07 වන ශතවර්ෂයේ සිට බුදුදහම ටිබෙටයට හඳුන්වාදීමත් සමඟ, එය විශාල පදනමක් මත වර්ධනය විය.

ටිබෙට් දේශය හෙවත් තිබ්බතය පෞඩ ඉතිහාසයකට නෑකම් කියන ශ්‍රේෂ්ඨ බෞද්ධ රාජ්‍යයකි. එය ලෝකයේ පියස්ස "The Roof of the world" යන විරුදාවලිය ලත්, මනස්කාන්ත හිම කඳුවලින් සෝභමානවත් වූ, සෞන්දර්යයෙන් අනූන දේශයකි. ක්‍රිඃව 07 වන සියවසේ දී ටිබෙට් දේශයට බුදුදහම ලැබුණු අතර එවකට ටිබෙට් අධිරාජ්‍යයාව සිටියේ සොන්ග්ත්සෙන් ගම් fmda (Srong- btsan gam-po) රජුය. එදවස පටන් එහි ඇති බුදුදහම හඳුන්වනු ලබන්නේ ටිබෙට් බුදුසමය, වජ්‍රයාන බුදුසමය හෙවත් තන්ත්‍රයාන බුදුසමය යනුවෙනි. වජ්‍ර යනු දියමන්තියයි. එය ශ්‍රේෂ්ඨත්වයේ, මහා අනර්ඝත්වයේ, අවිනාශි බවේ, සියල්ල අභිබවා පැවතීමේ සංකේතය නිරූපණය කරයි. මෙම ආගමික ඉගැන්වීම සඳහා වජ්‍රයානය යන නාමය යෙදී ඇත්තේ ද, එහි ඇති ස්ථිරභාවය හුවා දැක්වීම පිණිසය.

එබැවින් ටිබෙට් රටට බුදුදහම ලැබුණ දවස පටන් මේ දක්වා ටිබෙට් දේශයේ සිටින වියත්හු රැසක් බුදුදහම රැකගනු වස් විශාල මෙහෙයක් සිදු කරති. එපමණක් ද, නොව ටිබෙට් බුදුසමයෙහි උන්නතිය විෂයෙහි ස්වදේශිකයන් පමණක් නොව විදේශීය විද්වතුන් ද, අප්‍රමාණ වූ දායකත්වයක් ලබා දී ඇත. ඒ අතර භාරතීය භික්ෂූහු ප්‍රමුඛ වෙති. ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය අතරට දේශීය විද්වතුන් ලෙස දායකත්වය ලබා දී ඇත්තේ, තොතොරි න්‍යත්සෙං (totori Nyatsen) රජු, සොන්ග්ත්සෙන් ගම් පෝ රජු, Lo-sem-tso නම් පඬිවරයාත්,

ථොන්මි සම්භෝතා නම් ඇමතිවරයා, සොන්ග්ත්සෙන් ගම් පෝ රජුගේ බිරිඳෑවරු වන භ්‍රිකුති (Bhrikuti) සහ වෙංග් (Wen-cheng;Tibe-Kong chu හෙවත් Kong jo) කුමරිකාවන් දෙදෙනා, ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan) රජු, දල්-බෝ-සාන් රජු, ඔහුගේ පුත් තුම්ලායි බාන් රාජ්‍යයා සහ දලයිලාමාවරුන්ය.

එමෙන් ම, ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය අතරට විදේශීය විද්වතුන් ලෙස දායකත්වය ලබා දී ඇත්තේ, බොහෝවිට භාරතීය පඬිවරුන් වන භික්ෂූන් වහන්සේලාය. ඒ අතරට ශාන්තරක්ෂිත, දේවසම්භව හෙවත් පද්මසම්භව, කමලශීල, දීපංකර ශ්‍රී ඥාන හිමිවරුන් අයත් වේ. තම ජිවිතයද පරදුවට තබමින් විවිධ අසීරු අවස්ථාවලදී මොවුන් ටිබෙට් දේශය තුළ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට කැප වී ඇත.

පර්යේෂණ අරමුණු

ප්‍රධාන අරමුණ

ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය විමර්ශනය කිරීම ප්‍රධාන අරමුණ වේ.

සෙසු අරමුණු

- ටිබෙට් බුදුසමයෙහි සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනය කිරීම
- ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දායක වූ භික්ෂූන් වහන්සේලා පිළිබඳ අධ්‍යයනය කිරීම
- ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දායක වූ ගිහි පඬිවරුන් පිළිබඳ අධ්‍යයනය කිරීම
- ටිබෙට් බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනය කිරීම

පර්යේෂණ ගැටලුව

ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය කෙබඳු අයුරින් ලැබී තිබුනේ ද යන්න මෙහි

පර්යේෂණ ගැටලුව වේ.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ටිබෙටයේ වජ්‍රයාන බුද්ධාගමේ වර්ධනයට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය පරීක්ෂා කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරිණි. එය මෙම සංසිද්ධි වටා ඇති ශාස්ත්‍රීය මතභේද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මෙම සම්ප්‍රදාය තුළ සංස්කෘතික සම්ප්‍රේෂණය සහ අනුවර්තන ක්‍රියාවලීන් ද ගවේෂණය කිරීමට උපකාරී විය. එහිදී ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කළ අතර Google Scholarහි පලවූ පර්යේෂණ ලිපි භාවිත කරන ලදි. ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේදී සම්මුඛ සාකච්ඡා සිදුකළ අතර බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි බෞද්ධ සංස්කෘතිය විෂයෙහි ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් දත්ත ලබාගැනීම සිදුකළ අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස විවිධ පර්යේෂකයන්ගේ පර්යේෂණ කෘති සහ පත්‍රිකා පරිශීලනය කෙරිණි.

සාහිත්‍යය විමර්ශනය

ආසියාවේ බෞද්ධ සංස්කෘතිය නමැති පර්යේෂණ සඟරාව මහාචාර්ය පනහඩුවේ යසස්සි හිමියන් සහ මහාචාර්ය කේ.ඒ. වීරසේන මහතා විසින් 2014 වර්ෂයේ දී රචනා කොට ඇත. මෙම කෘතිය තුළින් විවිධ රටවල සංස්කෘතීන් හා දර්ශනයන් හඳුනාගත හැකිය. කොරියාව, චීනය, ජපානය වැනි රටවල් මෙන් ම ටිබෙට් රාජ්‍ය පිළිබඳත් මෙහි ශාස්ත්‍රීය කරුණු අන්තර්ගත වේ. විශේෂයෙන්, ටිබෙට් බෞද්ධ සංස්කෘතිය සහ ටිබෙට් බෞද්ධ සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය කොට ඇත. එහිදී ටිබෙටයේ බෞද්ධ සංස්කෘතිය, ප්‍රාග් බෞද්ධ ආගමික පසුබිම, බුදුදහම හඳුන්වාදීම ආදිය පිළිබඳවත්, ටිබෙට් සාහිත්‍යයෙහි ආරම්භය හා සංවර්ධනය, ටිබෙට් පිටක සාහිත්‍යය බිහිවීම, කන්ජූර් පිටක සාහිත්‍යය අන්තර්ගතය, ටන්ජූර් පිටක සාහිත්‍යය සහ ලෞකික සාහිත්‍යය කෙරෙහි බෞද්ධ බලපෑම පිළිබඳවත් සාකච්ඡා කොට ඇත. තන්ත්‍රයානය පිළිබඳ හැඳින්වීමක් යන ග්‍රන්ථය කහපොළ සුගතරතන හිමියන් විසින් රචනා කොට ඇත. තන්ත්‍රයානයේ ප්‍රභවය පිළිබඳ විවිධ මතවාද මෙහි රචනා කොට ඇත. තන්ත්‍රයානයෙහි කාල නිර්ණය, ආදී

කතෘවරුන් මෙන් ම තාන්ත්‍රික කතුවරුන්, ප්‍රධාන පීඨ, තාන්ත්‍රික ශාඛා පිළිබඳවත් සහජයානය, කාලචක්‍රයානය, පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති පර්යේෂණ ග්‍රන්ථයකි.

තාන්ත්‍රික බුදුසමය යන පර්යේෂණ ග්‍රන්ථය රචනා කරන ලද්දේ නාඔටුන්නේ විමලඤාණ හිමියන් විසිනි. මෙම පර්යේෂණ කෘතියෙහි තන්ත්‍ර යන්න හැඳින්වීමත්, ආදී බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි තන්ත්‍රවල බලපෑමත්, නිකායාන්තරික ඉගැන්වීම් තුළින් කෙරෙන තාන්ත්‍රික බලපෑමත්, තන්ත්‍රයානයෙහි ඓතිහාසික පසුබිම, තන්ත්‍රයානයෙහි විවිධ ප්‍රභේද, තාන්ත්‍රික බුදුදහමේ දාර්ශනික හා ආගමික පසුබිම, යන අනු මාතෘකාවන් ඔස්සේ සාකච්ඡාවට වජ්‍රයාන බුදුදහම බඳුන් කොට ඇත. මාගම්මන පඤ්ඤානන්ද හිමියන් විසින් රචිත පශ්චාත් කාලීන නූතන ප්‍රවණතා යන පර්යේෂණ කෘතිය වජ්‍රයාන බුදුදහම පිළිබඳ රචනා වූ කෘතියකි. මෙම කෘතියේ දී මහාචාර්ය දීපංකර ශ්‍රී ඥාන හිමියන් ගැන රචනා වී ඇති අතර වජ්‍රායාන බුදුදහමෙහි සුවිශේෂතා අධ්‍යයනය කරයි. එම කෘතියේ ඇති වජ්‍රයාන බුදුසමය පිළිබඳ මෙම පර්යේෂණයෙන් වැඩිදුරටත් අධ්‍යයනය කරයි. ටිබෙට් බෞද්ධ සාහිත්‍යය පිළිබඳ මිරිස්වත්තේ විමලඥාන හිමියන් විසින් රචනා කොට ඇති අතර, එහි ටිබෙට් බෞද්ධ සාහිත්‍යය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරයි. ටිබෙට් බුදුසමයේ ආරම්භය විකාශය සාකච්ඡා කරන අතර, කන්ජූර් සාහිත්‍යයේ අන්තර්ගතය ආදිය අධ්‍යයනය කරයි. බඹරුන්දේ සිරිසීවලි හිමියන් විසින් බෞද්ධ ලෝකය නැමැති ග්‍රන්ථය 1956 දී රචනා කොට ඇත. එහි අන්තර්ගත වී ඇත්තේ, රටවල්වල විවිධ සම්ප්‍රදායයන් පිළිබඳවය.

තව ද එහි ආදී බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි තාන්ත්‍රයාන දර්ශනයේ බලපෑම පිළිබඳව සාකච්ඡා කොට ඇති අතර, පැරණි සූත්‍ර, විනය ඉගැන්වීම්වලත්, හීනයාන ගුරුකුලවල, මහායාන ගුරකුලවල මෙන් ම මහායාන සූත්‍ර තාන්ත්‍රික ලෙස යොදා ගන්නා අයුරු විධිමත් ව සාකච්ඡා කොට ඇත. සුදර්මදීපනි යන කෘතිය 2019 වර්ෂයේ දී මාගම්මන පඤ්ඤානන්ද හිමි, තෙලිජ්ජවිල ධම්මින්ද හිමි සහ නිකපිටියේ ධම්මවිජය හිමි යන හිමිවරුන් විසින් රචනා කොට ඇති අතර එහි වැලිමඩගම කුසලධම්ම හිමියන්ගේ ශ්‍රී ලාංකේය

බෞද්ධ කලා ශිල්පයන්හි තාන්ත්‍රික අභාසය යන ලිපිය අනුරාධපුර, පෙළොන්නරු යුග ඇසුරින් රචනා වී ඇත. එහි තාන්ත්‍රික බුදුසමයේ ආගමනය, මූර්ති හා කැටයම්, ගෘහ නිර්මාණ ශිල්පය ආදිය හොඳින් අධ්‍යයනය කොට ඇත. නමුත් මෙහි වෙනත් රටවල්වල තාන්ත්‍රික බුදු සමය ගැන සාකච්ඡා කොට නොමැත.

එබැවින්, මෙම පර්යේෂණය මඟින් ඉහත පර්යේෂණ ග්‍රන්ථවල සාකච්ඡා කොට නොමැති පැතිකඩ විවරණකොට ඇති අතර එම ග්‍රන්ථවල ඇති සුවිශේෂී කරුණු වඩාත් උචිත අයුරින් මෙම පර්යේෂණයෙහි සාර්ථකත්වය සඳහා යොදාගෙන ඉදිරිපත් කරයි. විශේෂයෙන් ටිබෙට් දේශයෙහි වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කෙරෙයි.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව බුදුසමයේ ජාත්‍යන්තර ව්‍යාප්තිය විෂයෙහි, ජිවිත පරිත්‍යාගයෙන් ක්‍රියාකළ බහුශ්‍රැත යතිවරයාණන් වහන්සේලාගේ ක්‍රියාකලාපය නිසා ආසියාවේ පමණක් නොව, මැද පෙරදිග හා යුරෝපය දක්වා බෞද්ධ ලෝකයේ අරුණලු පැතිරිණ. එම ශ්‍රාවකයන් වහන්සේලාගේ ශ්‍රද්ධා මහිමයත්, ප්‍රඥාවන්ත භාවයත් නිසා ලෝකයේ අතිදුෂ්කර ගිරිදුර්ග සහිත හුදකලා රාජ්‍යයන්හි පවා බුදුදහම ව්‍යාප්ත විය. ටිබෙටයේ ද, වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය විද්වතුන්ගේ දායකත්වය නොමසුරු ව ලැබිණ. එබඳු උදාර ශාසනික සේවයක් කළ මහා පඬිවරුන් රැසකි. විශේෂයෙන් ම, ක්‍රි:ව 08 සියවසේ සිට 12 වන සියවස දක්වා භාරතීය බෞද්ධ පඬිවරු රැසකගේ දායකත්වය ටිබෙටයට ලැබිණි. ඉන්දියාවෙන් ගෙන පැමිණි බෞද්ධ ග්‍රන්ථ පරිවර්තනය මෙන් ම, භාරතීය විශ්වවිද්‍යාලවල ටිබෙට් භික්ෂූන් පුහුණු කිරීම ද, මෙම කාලයේ දී සිදුවිය. ඉන්දියාවෙන් ටිබෙටයට පඬිවරු අටක් හෝ නම දෙනෙකු බැඟින් ගිය බවත්, එහි අවසාන භික්ෂුව වනරතන වන බවත් සඳහන්ය. ශාන්තරක්ෂිත, දේවසම්භව හෙවත් පද්මසම්භව, කමලශිල, දීපංකර ශ්‍රී ඥාන ආදීන් ටිබෙට් දේශයේ උන්නතියට කැප වූ විදේශිය විද්වතුන් අතර ප්‍රමුඛත්වයක් හිමි වේ. ඒ අතරින් දීපංකර ශ්‍රී ඥාන හෙවත් අතීෂ හිමියන්ට සුවිශේෂීත්වයක් හිමි වේ. මේ අය බොන් දහම පරදවා බුදුදහම තහවුරු කිරීමට කටයුතු කර

ඇති නිසාම වජ්‍රයාන බුදුසමයට ඔවුන් දැක් වූ දායකත්වය අගය කොට නිම කළ නොහැකි වේ. එබැවින් මෙම පර්යේෂණ මඟින් වජ්‍රයාන බුදුදහමෙහි උන්නතිය උදෙසා කැපවුණ ශාස්ත්‍රීය විද්වතුන් පිළිබඳ ප්‍රාමාණිකව අධ්‍යයනය කෙරෙන්නේ වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ බෞද්ධ සංස්කෘතිය විෂයෙහි ටිබෙට් බෞද්ධ සංස්කෘතිය හා ටිබෙට් බෞද්ධ ආචාර්යවරුන් පිළිබඳ ශාස්ත්‍රීය කතිකාවත් අවම නිසාවෙනි.

ශාන්තරක්ෂිත හිමි

ශාන්තරක්ෂිත හිමි යනු ඉන්දියාවේ 08 වැනි සියවසේ ජීවත් වූ බුදුදහමේ විශිෂ්ට දාර්ශනිකයෙකු වූ ආචාර්යවරයෙකි. ඔහු ටිබෙට් බුදුසමයේ ආරම්භයට බෙහෙවින් දායක වී තිබේ. යථාර්ථවාදය, මාධ්‍යමික දර්ශනය පිළිබඳ විශාල දැනුමක් ඔහු සතු විය. බෞද්ධ න්‍යාය ශාස්ත්‍රයේ සංවර්ධනයට උරදුන් පඬිවරයෙකු වශයෙන් ද උන්වහන්සේ ඉතිහාසයට එක් වී ඇත. (කළුආරච්චි, 2025, පි. 54) ශාන්තරක්ෂිත හිමියන් උපත ලබන්නේ, ක්‍රි:ව (660-705) බෙංගාලයේ පාල රාජ්‍ය සමයේ සාහෝර්හි රජ පවුලකය. පසුව නාලන්දා විශ්වවිද්‍යාලයට ඇතුළත් වී අධ්‍යාපනය හදාරා එහිම මහාචාර්යවරයෙකු විය. මොහු විචක්ෂණ පඬිවරයෙකු වූ අතර, යෝගාචාර්ය සම්ප්‍රදායේ කීර්තිමත් පඬිවරයෙක් ලෙස ඉතා ම ප්‍රසිද්ධ විය. ධර්මය පිළිබඳ උතුම් දැනුමක් පැවති ඔහු මධ්‍ය ආසියාවට බුදුදහම ප්‍රචාරය කිරීමේදී වටිනා කාර්යභාර්යක් ඉටුකොට ඇත. (සාසනරතන හිමි, 1952, පි. 292)

එවකට ටිබටයේ රජ කළ ක්‍රි-සෝන්-ඉඬේ සාන් (Khri-Sron-Ide-Bstan) රජු ය. එතුමා ක්‍රි:ව (755 සිට 797) විසින් භාවවිවේක පාදයන්ගේ ස්වතාන්ත්‍රික මාධ්‍යමික සම්ප්‍රදාය පිළිගත් ශාන්තරක්ෂිත ගැන අසා ඉතා සතුටු විය. පසුව දක්ෂ පඬිවරයෙකු දූත මෙහෙවරෙහි යොදවා එතුමාගේ කාලයේ දී, එම රජුගේ ආරාධනාවකින්, ඉන්දියානු බුදුසමය ටිබෙටයේ ව්‍යාප්ත කර ඇත. නමුදු, එම කාර්යය නිෂ්ඵල වූ අතර දෙවනුව, රජු විසින් ශාන්තරක්ෂිත භික්ෂුවගේ ඉල්ලීම පරිදි තාන්ත්‍රික සම්ප්‍රදායේ සුප්‍රසිද්ධ දේශකයෙකු වූ පද්මසම්භව ආචාර්යවරයා කැඳවන ලදි. ඔහු මන්ත්‍ර, තන්ත්‍රයාන ක්‍රම සහ භාවනා පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති අයෙකු ලෙස සැලකෙයි.

ටිබෙටයේ දී පද්මසම්භව විසින් රතු හිස් වැසුම් නිකාය නමින් නිකායක් පිහිටුවන ලදි. බෞද්ධ භික්ෂූන්ට අග තෙක් හුල්ව ගිය හිස් වැසුමක් අවශ්‍ය යැයි කල්පනා කළ ඔවුන්, කලු හිස් වැසුමෙන් යුතු බොන් පූජකයන්ගෙන් මොවුන් වෙන් කර හඳුනා ගැනීමක් විය. (ආනන්ද හිමි, කාන්ගහආරච්චි, 1963, පි. 185) ආචාර්ය පද්මසම්භව එසේ කරන්නට ඇත්තේ බොන් පූජකයන් පරාජය බව දැක්වීමටය. එතුමා ඔවුන් පරාජය කළා පමණක් නොව බොන් පූජකයන් තුළ තිබූ හොඳ දේ හොඳ වශයෙන් ගෙන ඒවා බෞද්ධ දර්ශනයට ගැළපෙන පරිදි, සංස්කරණය කළේය. පද්මසම්භව ලැබූ මේ ජයග්‍රහණය නිසා ශාන්ත රක්ෂිත භික්ෂුවට නැවත, තිබ්බතයට පැමිණ ධර්මදූත ව්‍යාපාරයෙහි යෙදීමට අවස්ථාව ලබාගෙන ඇත. බොන්වරු මෙයට විරුද්ධවීම නිසා නේපාලයට පලාගොස් ඝාතනයට ද ලක් ව ඇත.

ශාන්තරක්ෂිත හිමියන් ලියූ කෘති අතර, "තත්වසංග්‍රහය" නමැති කෘතිය (මොරටුවගම, 2011, පි. 113) ඉතා නිර්මාණශීලි එකක් විය. එය ශ්ලෝක 500 කින් සමන්විත විය. එය බෞද්ධ දර්ශනය පිළිබඳ මහා විවරණයක් ලෙස සැලකිය හැකිය. මෙතුමා ටිබෙටයේ සම්රජ නම් විහාරය නමින් විහාරයක් ද, කරවා ටිබෙට් දේශයේ වජ්‍රයාන බුදුසමය ව්‍යාප්ත කිරීමට කටයුතු කොට ඇත. රදළ කුමාරුවරු 13 නමක් ටිබෙට්හි පැවිදි කළ මෙතුමා ටිබෙට්හි වජ්‍රයාන බුදු සමයේ උන්නතියට දායක වූ ප්‍රථම විදේශීය හෙවත් භාරතීය හිමි නම ද, විය. තිබ්බතයේ ධර්ම ප්‍රචාරයේ නිරත වූ මෙතුමා අවසානයේ දී ක්‍රි:ව 762 දී අපවත් වූහ.

දේව සම්භව හිමි

ක්‍රි:ව 08 වන ශතවර්ෂයේ ජීවත් වූ මෙතුමා ඉන්දියාවේ උද්‍යාන ප්‍රදේශයේ පාලනය කළ බෝධි රජුගේ පුතා පද්මසම්භවයි. එතුමා දේවසම්භව නමින් ද හඳුන්වයි. ටිබෙට් වජ්‍රයාන බුදුදහමේ ඉතාම වැදගත් ආචාර්යවරයෙකු ලෙස ඔහු හඳුන්වයි. උන්වහන්සේගේ ජීවන චරිතයේ අත්දැකීම් බොහෝය. නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රසිද්ධියට පත් වූ මෙතුමා යෝගාචාර සම්ප්‍රදායේ ප්‍රවීණයකි. ක්‍රි:ව 743 දී, ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan) රජුගේ යුගයේ ඔහුගේ ඇරයුමෙන් ඉන්දියාවේ සිට ටිබෙටයට පැමිණ ශාන්තරක්ෂිත හිමි

සමඟ ධර්ම ප්‍රචාරයේ යෙදී ඇත.

උන්වහන්සේ ධාරණී පිළිබඳව ප්‍රසිද්ධ වූ අතර සිද්ධි බලය තිබී ඇති බව ප්‍රකාශ කරයි. ටිබෙට් රටට බුද්ධාගම ලැබෙන්නට පෙර එරට තිබී ඇත්තේ බොන් දහමයි. ශාන්තරක්ෂිත, දේවසම්භව දෙදෙනාගේ ඉගැන්වීම් බොන් නම් ප්‍රාථමික ආගමේ ඇදහීම් සමඟ මිශ්‍ර වී ලාමා ආගම නම් වූ අමුතු ආගමක් ද, හට ගත්තේය. මොහු ටිබෙට්හි අවුරුදු 500 පමණ ධර්ම ප්‍රචාරයෙහි යෙදුණේය. (සාසනරතන හිමි, 1952, පි. 292) නියෙන් මා පා (Nying ma pa sect) නිකායේ ආරම්භකයා ද වේ. නූතනය වන විටත් මෙම නිකාය අදහමින් විශ්වාස කරන පිරිසක් සිටිති. එතුමා ආරම්භ කළ මෙම නිකාය රතු තොප්පිය නමින් හැඳින්වේ. එතුමන් ලාමා ආගමේ නිර්මාපකයා ලෙස නම් කෙරෙන අතර උන්වහන්සේගේ ප්‍රතිමාවට වර්තමානයේදීත් ටිබෙට් වැසියෝ ගරු කරති. මෙතුමාගේ රූපයෙහි දකුණු අතේ වජ්‍රයක් ද, වම් අතේ මිනී හිස් කබලක් ද, කිසිල්ලෙහි මිනී හිසක් ඇණුන ත්‍රිශූලයක් ද ඇත.

ටිබෙට් ජාතිකයන්ගේ අදහස අනුව මොහුට භාර්යාවන් දෙදෙනෙක් වෙති. එම දෙදෙනා නිතරම ළඟ සිටිති. ඉන් එක් භාර්යාවක් මීදි යුෂ හා ලේ සහිත මිනි හිස් කබලකින් ගෙන පිළිගන්නවයි. එක්තරා යක්ෂ රජකු ශරීරට ආවේශ වූ, පද්මසම්භව අවුරුදු ගණනක් ම යක්ෂ පුරයෙහි රජ කර වූ, බව ටිබෙට් වැසියන්ගේ විශ්වාසයයි. සමය පංක්පිකා නම් ග්‍රන්ථය පද්මසම්භවගේ කෘතියයි. ආනන්ද ප්‍රඥා නම් භික්ෂුවක් පසු කාලයේ දී ටිබෙට් බසට පරිවර්ථනය කරන ලදි. (සාසනරතන, 1952, පි. 293)

කමලශිල හිමි

ක්‍රි:ව 750 දී පමණ විසූ කමලශීල හිමි ශාන්ත රක්ෂිත ආචාර්යයන්ගේ ශිෂ්‍යයා වේ. ඉන්දියාවේ නාලන්දා විහාරයෙහි ප්‍රවීණ ආචාර්යවරයෙකු ලෙස සේවය කොට ඇත. පරසමයවාදීන්ගෙන් බුදුසමයට එල්ල වූ විවේචන න්‍යාය ආදී විෂයක්ෂේත්‍ර ආධාර කොට ගෙන මැඩපැවැත්වීමෙහි ලා උන්වහන්සේගෙන් ඉටු වී ඇති සේවාවද ප්‍රසංශනීය වේ. එතුමන් විසින් රචිත න්‍යාය බින්දු පූර්වපක්ෂසංක්ෂිප්ත නමැති ග්‍රන්ථය ඒ සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකිය. (කළුආරච්චි, 2025, පි. 54) කමලශීල

හිමියෝ ටිබෙට් බුදුසමය දියුණු කිරීමේදී විශාල දායකත්වයක් ලබාදුන් පුරෝගාමියෙකි. ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකු වූ මෙතුමාගේ පාඬිත්‍යය නිසා මෙතුමා ද, ටිබෙට් රටෙහි රජතුමා විසින් කැඳවන ලදි. කමලශිල හිමි ටිබෙට් රටට පැමිණෙන විට, එහි ශාන්තරක්ෂිත සහ පද්මසම්භව යන ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් විවේචනයට භාජනය වෙමින් පැවතිණි. එබැවින් මෙතුමා ඒ සියලු ප්‍රතිවාදීන් සමඟ වාද කොට ඔවුන් මැඩලීමට කටයුතු කොට ඇත. එතුමන් මාධ්‍යමික බෞද්ධ දර්ශනය අනුගමනය කොට ඇත. මෙතුමා ධර්ම ග්‍රන්ථ 18 පමණ ලියා ඇත.

අමතර ව, තම් ලේ ලිං විහාරයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කොට ඇත. නාලන්දා විශ්වවිද්‍යාලයෙහි යෝගාචාර්ය, මහාචාර්ය වූ ශාන්තරක්ෂිත හිමිගේ ශිෂ්‍යයෙකු ලෙස එතුමා සලකා ඇත. පසුව ටිබෙට් රටට ගොස් ධර්මය ප්‍රචාරය කිරීමත්, වාද-විවාද සහ ලේඛන සම්පාදනයත් සිදුකොට ඇත. මෙම හිමි සමඟ ඉන්දියාවේ පඬිවරු රාශියක් ටිබෙටයට පැමිණ ඇත. මොහුගේ කෘති අතර, ආර්යසප්තශති ප්‍රඥා පාරමිතා ටීකා, ආර්යවජ්‍රච්ඡේදික ප්‍රඥා, පාරමිතා ටීකා, ප්‍රඥා පාරමිතා හෘදය ටීකා යන කෘති වැදගත් වන අතර න්‍යායබින්දු පූර්ව පක්ෂ සංක්ෂිප්තය, තත්ත්ව සංග්‍රහ පඤ්චිකාව යන ග්‍රන්ථ 02 ප්‍රධාන ය. (මොරටුවගම, 2011, පි. 113)

කමලශීල හිමි ඇතුළු පිරිසගේ මතය වූයේ, චීන ධ්‍යාන් නිකායන්ගේ මතය වූ, බුද්ධත්වය යන බෝධිසත්ව ප්‍රතිපදාව හා බැදුණු ශික්ෂා ප්‍රගුණ කිරීම මඟින් අවබෝධය ලබාගත නොහැකි බවයි. මෙම මතය බැහැර කරමින් දක්වා ඇත්තේ, බුද්ධත්වය ක්ෂණයකින් අවබෝධ කර ගත හැකි බවයි. බුද්ධත්වය සඳහා පිළිපැදිය යුතු ප්‍රතිපදාවක් නොමැති බවත්, සිත හා සිතුවිලි නිරෝධ කිරීමෙන් ක්ෂණයකින් අවබෝධ කරගත හැකි බවත්, චාන් නිකායිකයන් පෙන්වා දී ඇත. මෙම මතවාද රජු දක්‍ෂ ප්‍රසිද්ධ විවාද පවත්වමින් ගැටුම නිරාකරණය කොට ඇත. එහිදී, කමලශීල හිමි ඇතුළු පිරිසගේ මතය ජයගෙන ඇත. එම නිසා ඉන්දීය භික්ෂුවට ධර්ම ප්‍රචාරක අවස්ථාව සැලසීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් මාධ්‍යමික සම්ප්‍රදායන් ටිබෙට්හි ද අඩංගුව ඇත. කමලශිල හිමි ටිබෙට් ජාතිය විශාල වශයෙන් සසුන්ගත කලේය. මෙහිදි ජැන් හිමියන් ප්‍රචලිත ශිෂ්‍යයෙකි. බුඩ්ටෙන්

නම් පුද්ගලයා පවසන්නේ, මෙම කමලශීල හිමි ද ඝාතනට පත් ව ඇති බවයි. උන්වහන්සේ ටිබෙටයේ දී, උතුම් බුදුවරයාණන් (Holy Buddha) ලෙස ද, පාරිශුද්ධ වූ ඉන්දියාවෙන් (Holy Indian) යන අන්වර්ථ නාමයෙන් ද, පිදුම් ලබා ඇත. උන්වහන්සේගේ ශ්‍රී දේහය ටිබෙට් අගනුවරට සැතපුමක් දුරින්, ආරාමයක තැන්පත් කර ඇත.

දීපංකර ශ්‍රී ඥාන හිමි

බුද්ධගයා පුද බිමට පෙර දිගින්, වික්‍රම පුරයෙහි ගවුර් නම් ප්‍රදේශයෙහි උපත ලැබූ බවත්, විහාර්යේ බගල්පූර්හි උපත ලැබූ බවත් ඉන්දීය පඬිවරයෙකු වූ රාහුල් සං ක්‍රත්‍යායන සඳහන් කරයි. කෙසේ වුවද, ක්‍රි:ව 980-1053 අතර, අතීශ දීපංකර හිමියන් හෙවත් ජෝ-වෝර්-ජේ (ටිබෙට් නාමය) ජීවත් විය. රත්න ශ්‍රී ඥාන, රත්නමදිපාද, රත්නමතිපාද, රත්න ශ්‍රී ඥානාචාර්ය යන නම්වලින් හඳුන්වන ලද්දේ මෙතුමා බව බොහෝ විද්වතුන්ගේ මතයයි. ආචාර්ය චන්ද්‍රගෝමීන්ගේ චාන්ද්‍රව්‍යාකරණයට පංඤ්චිකාව ලියුවේ ද, මෙතුමායැයි පිළිගැනෙයි. රාජකීය පවුලකට අයත් අතීශ හිමියන් බෞද්ධ පඬිවරුන් අතර, දීප්තිමත් තාරකාවකි. කීර්තිමත් භාෂා ශාස්ත්‍රයෙකු වූ ජේතරී නම් පඬිවරයෙකු යටතේ කුඩා කළ ශිල්ප හදාරා ඇති අතර, ළමා කාලයේ ම පංච විද්‍යාවන් හදාළ මෙම කුමාරයා ආගම්, දර්ශන හැදෑරීමට රුචිකත්වයක් දැක්වී ය. අනාගතයේ මහා ප්‍රඥයෙකු වීමේ ලක්ෂණ හෙළි කරමින්, වයස 10 වන විට වෛද්‍ය විද්‍යාව පමණක් නොව ලලිත කලා සහ සාහිත්‍යයේ ද, ප්‍රවීණත්වයට පත් වී ඇත.

ථේරවාදී ත්‍රිපිටකය හා මහායාන දර්ශනය පිළිබඳ විශාරදත්වයට පත් මෙතුමා මාධ්‍යමික, යෝගාචාර, වෛශේෂික න්‍යාය හා තන්ත්‍ර විෂයෙහි ද මහා පණ්ඩිතභාවය ප්‍රකට කළේ ය. විශේෂයෙන් ම, ක්‍රිෂ්ණගිරි විහාරයේ වැඩ සිටිමින් රාහුල ගුප්ත හිමියන් යටතේ ගුහ්‍ය ඥාන වජ්‍ර යන නමින්, හඳුන්වන මහායාන ඉගැන්වීම් වෙත වඩාත් නැඹුරු විය. මහාසාංඝික ආචාර්ය ශිල හිමියන්ගේ උපාධ්‍යත්වයෙන්, වයස 21 දී උපසම්පදාව සම්පූර්ණ කොට දීපංකර ශ්‍රී ඥාන යන ගෞරව නාමය හිමි කර ගන්නා ලදි. විශේෂයෙන් බුදුදහමට අභියෝග කළ බොහෝ උගතුන් උන්වහන්සේ වෙතින් පරාජය විය. ඇතැම් විට බහුශ්‍රැත භික්ෂූන් පවා අතීශ හිමියන් ඉදිරියේ දුර්මුඛ විය. ද්‍රව්‍ය ලෝකයේ

පවත්නා සියල්ල තුළ පවතින්නේ ශූන්‍යතාව බව උන්වහන්සේ අවබෝධ කර ගත්හ. මෙකල භාරතයේ කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වූ, වික්‍රමශිලා මහා විහාරයේ සිටි ප්‍රකට ආචාර්යවරයෙකු වූ, නරෝපා හිමියන්ගේ (පඤ්ඤානන්ද හිමි, පි. 112) අති දක්ෂ ශිෂ්‍යයන් අතරට, උන්වහන්සේ ද අයත් විය. එම අනෙත් දක්ෂ භික්ෂූන් වූයේ, ප්‍රඥා රක්ඛිත, කණක සිරි, මනක සිරි ආදීන් ය.

ලෝකයේ විවිධ රටවලින් පැමිණි බුද්ධිමත් ශිෂ්‍යයන් නරෝපා ආචාර්යවරයා යටතේ උගත් අතර ටිබෙටයේ සිද්ධ ආචාර්වරයෙකු වූ මිලාරේපා නම් පඬිවරයාගේ ගුරුවරා වූ මාර්පා ද, ඔහුගේ අනුග ාමිකයෙකු විය. (බාපත් පී.වී. 1956, පි. 279) වික්‍රමශීලා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය නිම කළ දීපංකර ශ්‍රී ඥාන හිමියෝ එකල බුද්ධගයාවේ වජ්‍රාසන මහා විහාරයේ වැඩ වසමින්, විනයධර මහා තෙර නමකගේ භික්ෂුවක් ලෙස විනය, අභිධර්මය ඇතුළු ත්‍රිපිටකය වර්ෂ 02 ක් තුළ හදාරා නිම කර තිබේ. එපමණකින් නොනැවති තන්ත්‍රයාන ඉගැන්වීම් ප්‍රගුණ කොට වයස 31 දී තන්ත්‍රයානික විශාරද ආචාර්යවරයෙකු විය.

එසේ ම, එම කාලයේ දී සුමාත්‍ර ජාවාවල වැඩ සිටි මෙම හිමියන් නමක් හමු වී ද බෝධි චිත්තය වර්ධනය කර ගැනීම පිළිබඳ අපූර්ව ඥානයක් ලබා ඇත. දීපංකර ශ්‍රී ඥාන හිමියන්ගේ ඥානය දෙපැත්ත කැපෙන කඩුවක් මෙන් වූ අතර, එම නිසාම බොහෝ දෙනෙකු එතුමා දැනගත්තට විය. සුමාත්‍රා සංචාරයේදී සංස්කෘත භාෂාව ඉගෙන ගෙන බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි ආචාර්වයවරු 151 දෙනෙකුගේ ආචාර්ය වරයා බවට පත්විය. අවසානයේදී වික්‍රමශිලාවේ උපකුලපතිධූරයට පත් විය (ගැන්ටර්. 1956, පි. 123)

දීපංකර ශ්‍රී ඥාන හිමියන් ටිබෙටයට පැමිණීම පිළිබඳ කතා පුවත් රාශියක් ඇත. අතීෂ හිමියනගේ ප්‍රථම ටිබෙට් පැමිණීම ගැන සරච්චන්ද්‍රදාස් හෙළි කරයි. ගුජ් රජුගේ වැඩිමහල් පුත්‍රයා වූ, ඥානප්‍රභා හෙවත් තොලින් අගනුවර සිට බොහෝ කාලයක් රට පාලනය කර තිබේ. තෝලීන් අගනුවර පිහිටි තෝඩීන්ග් ආශ්‍රමය ඥානප්‍රභා විසින් පිහිටවන ලද අතර, ටිබෙටයේ ඒ වකවානුවේ ඇවිලෙමින් තිබූ සියලු ආගමික මතභේදයන් සමතයකට පත් කරනු වස්, තන්ත්‍රයානය වැඩි

වේගයකින් පැතිර තිබුණි. තන්ත්‍රයානය හෙළා දකිමින් ග්‍රන්ථ රැසක් ද, මෙකල රචනා විය.

අතීෂ හිමි නොයෙක් රාජ්‍යවල සංචාරය කිරීමෙන් ලත් අත්දැකීමෙන් බෞද්ධ දර්ශනයට ග්‍රන්ථ රාශියක් නිර්මාණය කොට ඇත. කාලචක්‍ර තන්ත්‍ර නම්, ග්‍රන්ථයට අටුවාවක් ලිවීමත්, බෝධිප්‍රදීප නමින් ග්‍රන්ථයක් මහායාන බෝධිසත්ව සංකල්පය තේරුම් ගෙන රචනා කිරීමත් සිදු කොට ඇත. ඉන්දියාවෙන් මෙතුමා ගෙන්වාගෙන ඇත්තේ, බිසන්-ග රස් දූතයා අත රත්තරන් විශාල ප්‍රමාණයක් තෑගි සඳහා අතීශ හිමියන්ට යවාය (ජේන්, 1980, පි.97) නමුදු එතුමා ඒවා පිළිනොගත් අතර වෙනත් පඬිවරයෙකු යවා විසින් එතුමා ගෙන්වාගෙන ඇත. දොළොස් වසරක් ටිබෙට් රාජ්‍ය තුළ අතීෂ හිමි සිටි අතර, උන්වහන්සේ ප්‍රධාන ශිෂ්‍යයා වූයේ දොම් තොම්ය. මෙම දොන් තොන් හිමි කදම්පා න්‍යාය ආරම්භ කළේ ය. එසේ ම, පසු කලෙක අපහසු ලෙස කාලය ගත කළ ඔහු 60 වන වියේ දී මරණයට පත්වුණි. මිය යෑමට පෙර මෙම හිමි තම ශිෂ්‍යයන්ට දේශනා කොට ඇත්තේ, සූත්‍ර ධර්ම පමණක් තම මාර්ගෝපදේශකයා කරවන ලෙසයි. ඔබට වෙනත් පිළිසරණක් නොමැති බවයි.

ටිබෙටයේ දී ද, එතුමාට දී තිබූ නම වූයේ, අතීශ (එසිය) යන්නයි. මෙය උන්වහන්සේට ගරුකිරීම සඳහා කරන ලද්දක් වූ අතර, විවිධ විචාරකයින් මෙය පසුව විවිධ අන්දමට විස්තර කර තිබේ. සම්බෝධිය කරා යන මාර්ගය (Lambrin Brde-Brkol) නම් ගැඹුරු ශාස්ත්‍රීය නිබන්ධනයේ දක්වා ඇත්තේ අතිශ යන්නෙහි තේරුම (phnl-hyun) විශිෂ්ට හෝ ලෝකොත්තර යන්නයි. එපමණක් ද නොව, ටිබෙට් රටේ සිටි ග්ලන් ඩර්මා (Glan-Der-ma) නම්, රජ කෙනෙකු විසින් බුද්ධාගම දැඩි හිංසනයට ලක් කිරීමෙන් පසු බුද්ධාගම නැවත ඇති කිරීමට කටයුතු කළ ප්‍රවීනත ම පුද්ගලයා වූයේ උන්වහන්සේය.

(Bstan-hgyur) බිස්ටන්-හ්ග්යූර් නොහොත් ශාස්ත්‍රීය නිබන්ධනවල එකතුවක් යනුවෙන් හඳුන්වන (Jo-bodhic chos chun) නම් ග්‍රන්ථය අතීශ හිමියන්ගේ රචනාවන් හා අතීශ හිමියන් සිය සම්ප්‍රදායට පදනම් කරගත් ශාස්ත්‍රීය හා වෙනත් ලියකියවිලිවල එකතුවකි. මීට අමතර ව, ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය භික්ෂූන්

වහන්සේලාගේ දායකත්වය අතරට අසංග, නාගර්ජුන දෙපලගේ සහ නරෝපා, විරූපා දායකත්වය ද දැක්විය හැකිය. විශේෂයෙන් ම ඔවුන්ගේ ඉගැන්වීම් ටිබෙට් ආරම්භක බුදු සමය හා බැඳී පවතී යයි සිතිය හැකිය. සිල්වින් ලෙවි Translation of Mahayana Sutralnkar නැමැති කෘතියේ දක්වන්නේ ආර්යය අසංග සමයේදී වජ්‍රයානය (තන්ත්‍රයානය) බිහි වන්නට ඇති බවය. ඔහු අසංග යනුවෙන් ටිබෙට් පොත්පත්වල සඳහන් වේ.

වින්ටර් නීට්ස් History of Indian Literture නැමැති කෘතියෙහි ආර්යය අසංග ක්‍රි:ව 04 වන සියවසෙහි විසූ බව කියයි. ඇතැමෙක් ඔහු ක්‍රි:ව 05 වන සියවසේ විසූ බව කියයි. නාගර්ජුනපාදයන්ගේ නම ද තවත් සමහරෙක් ආරම්භකයා ලෙස දක්වති. ඒ අනුව, අසංග හෝ නාගර්ජුන නාමයෙන් කිහිපදෙනෙකු සිටි බව සිතිය හැකි නමුත් එම මත පිළිගැනීමට නොහැකි ය (යසස්සි හිමි, 2019, පි. 331).

ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය ගිහි පඬිවරුන්ගේ දායකත්වය

ඉහත පරිදි ටිබෙට් බුදුසමයේ උන්නතියට භික්ෂූන් වහන්සේලා තම ජිවිත පරිත්‍යාගයෙන් කැප වී ඇත. දෙස්-විදෙස් වශයෙන් නොසලකා සැවොම තම මව් රට මෙන් ටිබෙට් දේශය සලකා කටයුතු කොට ඇති අතර, ටිබෙට් රටෙහි වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය ගිහි විද්වතුන්ගේ දායකත්වය ද නොමසුරු ලැබී ඇත. විශේෂයෙන් රජවරුන්ගේ දායකත්වය දැක්විය හැකිය. ඒ අතර, තොතොරි න්‍යත්සෙං (totori Nyatsen) රජු, සොන්ග්ත් සෙන් ගම් පෝ රජු (Lo-sem-tso), ථොන්මි සම්භෝතා නම් ඇමතිවරයා, සොන්ග්ත්සෙන් ගම් පෝ රජුගේ බිරිඳැවරු වන භ්‍රිකුති (Bhrikuti) සහ වෙංග් (Wen-cheng;Tibe-Kong chu) හෙවත් (Kong jo) කුමරිය, ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan) රජු දල්-බෝ-සාන් රජු හා ඔහුගේ පුත් තුම්ලායි ඛාන් රාජ්‍යයා සහ දලයිලාමාවරුන් ද දැක්විය හැකිය.

තොතොරි න්‍යත්සෙං (totori Nyatsen) රජු

ක්‍රි:ව 371 දී ටිබෙට් රජතුමා ලෙස සිටි තොතොරි න්‍යත්සෙං (totori

Nyatsen) රජු ඉදිරියේ ප්‍රාතිහාර්යාත්මක ලෙස පෙනී සිටි විදේශික උගතුන් පස් දෙනෙකු රජුට අගනා අනාවැකියක් හා උපදේශයක් දී තිබේ. එනම්, ක්‍රි:ව 331 දී ස්වර්ගයෙන් පහළ වූ කුඩා කරඬුවක් "ඔම් මණි පද්මේ හූම්" මන්ත්‍රය කැටයම් කරන ලද මැණිකක්, ආදී පූජා වස්තු කිහිපයක් ඇති බවත්, ඒවා ටිබෙට් දේශයෙහි පොදු සුභ සිද්ධිය සඳහා යොදාගත හැකි බවත්, ඒවායෙහි වටිනාකම කිසිවකු විසින් හඳුනාගෙන නැති බවත්, ඔවුන් එසේ පවසා අතුරුදහන් වූ බවත් කියවේ. රජතුමා ද අවශ්‍ය අදාල වස්තු සොයාගෙන පිළිවෙත් පුරමින් ගෞරව දක්වූ බව ද, එහි ප්‍රතිඵලයක් ලෙස එතුමාට නිරුපද්‍රිතව රාජ්‍ය පාලනය කිරීමටත්, සෞභාග්‍යය හා සෘද්ධිමත් දේශයක් ගොඩ නැඟිමට වසර 119 ක ආයුෂ වන්දනය කිරීමටත්, අවකාශ ලැබුණ බව ද දක්වේ. මේ පිළිබඳ වෙනස් අදහසක් දක්වන Soma De kors පවසන්නේ මෙකී පූජා භාණ්ඩ අතර, කිසියම් කෘතියක් පැවතී බවත්, රජතුමාට සිය මාළිගයට ඉහළින් ස්වර්ගයේ සිට හඬක් නැඟී පරම්පරා රැසකට පසුව එම කෘතියෙහි දේ හෙළි වෙතැයි කියූ බවත් ය.

සොන්ග්ත්සෙන් ගම් පෝ රජු

සොන්ග්ත්සෙන් ගම් පෝ රජු දවස විදේශික පඬිවරුන් පිරිසක් කිසියම් ආගමික කෘති සමූහයක් රැගෙන පළමුවෙන් ම ටිබෙටයට පිවිසි බව ටිබෙට් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වේ. එහෙත් එවකට ලේඛන කලාව නොපැවති බැවින්, එකී කෘති තේරුම් ගැනීමට හැකි වූයේ සොන්ග්ත්සෙන් ගම් පෝ දවස බව ද සඳහන් වේ. එවකට සිටි ථෝන්මී සම්භෝතා නම් ඇමතිවරයා එහි මූලිකයා විය. රජතුමා හෙතම ඉන්දියාවට යවා ඇති අතර, ඉන්දියාවේදී ලේඛන කලාව ප්‍රගුණ කොට ටිබෙට් දේශය වෙත පෙරළා පැමිණ ඔහු එහිදී ටිබෙට් භාෂාව නිර්මාණය කළේය. රජතුමා ද සම්භෝතාගේ සහාය ඇතිව ලිවීම, කියවීම හුරු පුරුදු වූ අතර, නවතම ආගමෙහි මූලිකයා ලෙස ද ක්‍රියා කලේය.

ක්‍රි:ව 07 වන සියවසේ දී ටිබෙටයට බුදුදහම ලැබුණු අතර, එවකට ටිබෙට් අධිරාජ්‍යයාව සිටියේ සොන්ග්ත්සෙන් ගම් පෝ (Srong- btsan gam-po) රජුය. එතුමාගේ පාලන කාලය ටිබෙට් දේශයේ ආගමික, සමාජික, ආර්ථික හා දේශපාලනික ඉතිහාසයෙහි ස්වර්ණමය යුගය

ලෙස සැලකෙයි. (යසස්සි හිමි, 2014, පි. 315) සිහසුනට පත් මෙම රජු, ලාෂා (Lasha) තම අග නගරය ලෙස තබා ගත් අතර, එවකට රතු පර්වතය (Red hill) නමින් ප්‍රකටව පැවති ස්ථානයෙහි තම රජ මාළිගය ඉදි කලේය.

සොන්ග්ත්සෙන් ගම් පෝ රජුගේ කුමාරිකාවන් දෙදෙනා

සොන්ග්ත්සෙන් ගම් පෝ රජුගේ කුමාරිකාවන් දෙදෙනෙකු වූ අතර, ඉන් එක් කුමාරිකාවක් වූයේ, නේපාලයේ අම්වර්මන් රජුගේ දියණියක වූ භ්‍රිකුති (Bhrikuti) ය. (යසස්සි හිමි, 2014,පි. 315) ඇය ටිබෙටයට පැමිණෙන විට, අක්ෂෝභ්‍ය (Mi Bskyod Rdo Rje) බුදුරජාණන්වහන්සේගේ ප්‍රතිමාවක් ද, රැගෙන ආවාය. එය තැන්පත් කිරීමට ගොඩ නඟන ලද විහාරය "phrul Snang" ලෙස හඳුන්වනු ලැබේ. අනෙක් කුමරිය වූයේ චීනයේ gex (Tang) රාජ වංශයට අයත්, තයිත්සුං (Taitsunng) රජුගේ දියණික වූ වෙන් චෙංග් (Wen-cheng;Tibe-Kong chu) හෙවත් (Kong jo) කුමරියයි. ඇය ද, ටිබෙට් දේශයට පැමිණෙන විට ශාක්‍යමුණි බුදුරදුන්ගේ ස්වර්ණමය ප්‍රතිමාවක් රැගෙන පැමිණි අතර, එය තැන්පත් කිරීම සඳහා කර වූ විහාරය "Ra mo che" නම් විය.

ඊට අමතරව බෞද්ධ පොත පත ද, ශාක්‍යමුණි බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රි සර්වඥධාතු හා අද්භූත ප්‍රාතිහාර්යය පෑමේ ශක්තිය ඇති ප්‍රතිමා කිහිපයක් ද, මෙම කුමරියන් දෙදෙනා ටිබෙටයට ගෙන පැමිණි බව ටිබෙට් බෞද්ධයෝ විශ්වාස කරති. එම නිසා ස්වකීය ජනයා අතර බුද්ධාගම හඳුන්වාදී ඔවුන් ශිෂ්ට කිරීමෙන් තම අභිලාෂය ඉටු කරගැනීමට රජුට හැකි විය. මෙම කුමාරිකාවරු දෙදෙනා බෞද්ධ විහාරස්ථාන, පාසල් ආදිය ටිබෙට් දේශය පුරා ඉදි කිරීමට අනුබල දුන්නා පමණක් නොව, සොන්ග්ත්සෙන් ගම් පෝ රජතුමා බෞද්ධයෙකු බවට පත් කොට ටිබෙට් දේශය පුරා බව ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කොට ඇත. මෙම කුමාරිකාවන් දෙදෙනාම ටිබෙට් ජාතිකයන්ගේ ගෞරවාදරයට පත් ව ඇත. මොවුන් දෙදෙනා මහායානයේ එන මහා කාරුණිකත්වයේ පරම ප්‍රතිබිම්භය ලෙස සලකන දොල්මා (dolma) හෙවත් තාරා දෙවඟනගේ මානව රූපී අවතාර ලෙස ද, ටිබෙට් බෞද්ධයෝ තදබල ලෙස විශ්වාස කරති.

උක්ත කුමාරිකාවන්ගේ මාර්ගෝපදේශනය මත සොන්ග්ත්සෙන් ගම් පෝ රජතුමා බුදුදහම ස්ථාපිත කිරීමට අවශ්‍ය තොරතුරු සම්පාදනය කළේය. එහිදී, විශේෂයෙන් ම තම අමාත්‍යවරයෙකු වූ, ථොන්මි සම්භෝතා ඇතුළු 16 දෙනෙකුගේ කණ්ඩායමක් ඉන්දියාවට යැවූ බව දැක්වේ.

Lo-sem-tso නම් පඬිවරයා

ටිබෙට් බුදුදහමෙහි සමාරම්භය සිදු වූයේ Lo-sem-tso නම් පඬිවරයාත්, Li-te-se නම් පරිවර්තකයා විසින් අදාල පොත්-පත් ටිබෙටයට රැගෙන විත්, තොතොරි න්‍යත්සෙන් රජුට පරිත්‍යාග කිරීම සමඟය. රජතුමා එතරම් උගත් කෙනෙකු නොවූ නිසා එකී කෘතිවල සඳහන් දෑ වටහා ගැනීමට අසමත් වුණි. ඒ නිසා පඬිවරයා හා පරිවර්ථකයා ආපසු ගියේය. මොවුන් කවර දේශයක සිට පැමිණියේ දැයි ඉතිහාස කෘතිවල සඳහන් නොවේ.

නමුදු මොවුන් චීනයේ සිට පැමිණි බව අනුමාන කරයි. ඇතැම් චීන භික්ෂූන් මැසිඩෝසියාව වැනි දුර බැහැර රටවලට ද ධර්මය ප්‍රචාරය කර ඇත. කෙතරම්, දුර බැහැර ප්‍රදේශවල ධර්මදූත කාර්යෙහි නිරත වූ චීන භික්ෂූන් තම දේශ සීමාවන්හි පිහිටි ටිබෙටයට නොපැමිණියේ ඇයිදැයි සිතිය නොහැකිය. බුදුදහම ටිබෙට් දේශයට හඳුන්වා දෙන ලද්දේ 05 වන සියවසේ වුව ද, එම සියවස තුළ එතරම් තදබල පරිවර්තනයක් හෝ බලපෑමක් සිදු නොවීය. නමුත්, සත්‍ය ලෙස ම බුදුදහම ටිබෙටය තුළ ව්‍යාප්ත වී ඇත්තේ ක්‍රි:ව 07 වන සියවසේදීය.

ථොන්මි සම්භෝතා නම් ඇමතිවරයා

සොන්ග්ත්සෙන් ගම් පෝ රජතුමාගේ බිරින්දෑවරුන් වූ කුමාරිකාවන්ගේ මාර්ගෝපදේශනය මත, සොන්ග්ත්සෙන් ගම් පෝ රජතුමා බුදුදහම ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කලේය. විශේෂයෙන් ම තම අමාත්‍යවරයෙකු වූ, ථොන්මි සම්භෝතා ඇතුළු 16 දෙනෙකුගේ කණ්ඩායමක් ඉන්දියාවට යැවූ බව දැක්වේ. එමඟින්, අපේක්ෂා කරන ලද්දේ, සංස්කෘත භාෂාව හැදෑරීම හා බෞද්ධ පොත-පත ටිබෙටයට ගෙන ඒමය. ඉන් වසර ගණනාවක පසු එනම්, ක්‍රි:ව 650 දී පමණ සිය

අරමුණු සපුරා ගෙන සම්භෝතා පමණක් පැමිණි අතර, ඉතිරි අය රෝගාබාධයන්ට ලක් ව ඇත. ඉන්දීය බ්‍රාහ්මීය අක්ෂර කලාව පදනම් කර ගනිමින්, ටිබෙට් අක්ෂර මාලාව නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ ද මෙකී ථොන්මි සම්භෝතාටය. සොන්ගත්සෙන් ගම්පෝ රජතුමාගේ මාර්ගෝපදේශකත්වය හෝ අභිප්‍රිත ධෛර්ය මත ඉටු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

ථොන්මි සම්භෝතා නම් ඇමතිවරයාගේ කාර්යය

චීනය, නේපාලය, ඉන්දියාව වැනි රටවල්වලින් පඬිවරුන් ගෙන්වා ගැනීම, එකී රටවලින් බුදුදහම පිළිබඳ විවිධ කෘති ගෙන්වා ගැනීම හා ඒවා ටිබෙට් බසට පරිවර්තනය කිරීමට විශේෂ අවධානය යොමු කිරීම, ටිබෙට් බසින් රචනා කල විවිධ කෘති සුලභ වීම, අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා සියලු කටයුතු සිදු කිරීම, රාජ්‍යය පුරා විහාර ආරාම 180 ක් කරවීම, භාරතයේ ධර්මාශෝක රජතුමා මෙන් රට පුරා තැනින් තැන ශිලා ලිපි, පුවරු ලිපි, ගොඩනැඟීමෙන් ධර්මානුකූල ව ජිවත්වීමට රටවැසියා උද්යෝගිමත් කිරීම, රටේ ජනතාව විසින් සුරකිය යුතු නිතී-රීති රෙගුලාසි මාලාවක් හා සදාචාර සමුදායක් ගොඩ නැඟීම ආදියයි. මෙකී නීති-රීති අනුව සොරකම්, මිනි-මැරුම්, පරදාර සේවනය, ආදි බර පතල ගණයේ අපරාධ ලෙසත්, ඊට අතර ව විශේෂ ගණයේ ශික්ෂා පද දහසකුත් හඳුන්වාදීම දැකිය හැකිය. එහි සඳහන් නිති-රීති පහත අයුරින් පෙන්වා දිය හැකිය.

දුර්ලභ ගණයේ නායකකාරාදීන්ට ගෞරව කිරීම හා විශ්වාස තැබීම, ආගම ඉගෙන ගැනීම හා ආගමික වතාවත් මැනවින් පිළිපැදිම, දෙමව්පියන්ට සැලකීම වැඩිහිටියන්ට හා උසස් පෙළපත්වල අයට ගරු කිරීම, ඥාති මිත්‍රාදීන්ට සංග්‍රාහ කිරීම, තමා උපන් රටට යහපතක් වන සේ ජිවත් වීම, අවංක වීම, ආහාර පාන හා වස්තු සම්පත් ආදිය අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීම, සත්පුරුෂ, යහපත්, ගුණවත් අය ආදර්ශයට ගැනීම, තමාට උදව් උපකාර කරන්නන් වෙත කෘතවේදී වීම, නිවැරදි කිරුම්-මිණුම් ක්‍රම භාවිත කිරීම ඊර්ෂ්‍යා පරවස නොවී සියල්ලන් ම සාමූහික ව කටයුතු කිරීම, යහපත් වචන කතා කිරීම හා සන්නිවේදන කුසලතා, දුක් වේදනා විෂයෙහි ඉවසිලිවන්ත වී හා උපේක්ෂා සහගත වීම යනාදියයි.

ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan)

ටිබෙටයේ බෞද්ධ ආගම රාජ්‍ය ආගම බවට පත් වූයේ, (ක්‍රි:ව 755 සිට 797) දක්වා රජ කළ ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan) රජුගේ කාලයේය. මෙම රජු විසින් නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ ශාන්තරක්ෂිත භික්ෂූව තිබ්බතයට කැඳවාගෙන ධර්ම ප්‍රචාරයේ නිරතව ඇත. ඔහුගේ වෑයම නිෂ්ඵල වී ඇත. එකල ලෙඩ, රෝග කුණාටු ආදි මේ භික්ෂුවගේ ජිවිතය පවා අනතුරුදායක තත්වයක පැවති හෙයින්, නැවතත් එම භික්ෂූව ඉන්දියාවට යවන ලදි. දෙවනුව, මේ රජු විසින් ශාන්තරක්ෂිත භික්ෂුවගේ ඉල්ලීම පරිදි තාන්ත්‍රික සම්ප්‍රදායේ සුප්‍රසිද්ධ දේශකයෙකු වූ, පද්මසම්භව ආචාර්යවරයා කැඳවන ලදී. ටිබෙටයේ දී පද්ම සම්භව විසින් රතු හිස් වැසුම් නිකාය නමින් නිකායක් පිහිට වන ලදී (ආනන්ද හිමි සහ කාන්ගහආරච්චි ආදිහු, 1963, පි. 185).

බෞද්ධ භික්ෂූන්ට අග තෙක් හුල්ව ගිය හිස් වැසුමක් අවශ්‍යයැයි කල්පනා කළ ඔවුන්, කලු හිස් වැසුමෙන් යුතු බොන් පූජකයන්ගෙන් මොවුන් වෙන් කර හඳුනා ගැනීමක් විය. ආචාර්ය පද්මසම්භව එසේ කරන්නට ඇත්තේ බොන් පූජකයන් පරාජය බව දක්වීමටය. එතුමා ඔවුන් පරාජය කළා පමණක් නොව බොන් පූජකයන් තුළ යහපත් දේ වශයෙන් තිබුණ අදහස් ගෙන ඒවා බුද්ධ ධර්මයට ගැළපෙන පරිදි, සකස් කළේය. පද්මසම්භව ලැබූ මේ ජයග්‍රහණය නිසා ශාන්ත රක්ෂිත භික්ෂුවට නැවත, තිබ්බතයට පැමිණ ධර්මදූත ව්‍යාපාරයෙහි යෙදීමට අවස්ථාව ලබාගෙන ඇත. බොන් ආගම සම්බන්ධ ඇමතිවරු පිරිසක් මෙම රජු ඝාතනය කළ අතර ඉන්පසුව ටිබෙටයේ ගාන්ධර්ම නමැති රජෙකු බොන් ආගමිකයන් රජෙකු බවට පත් කළ ද, මොහු විශාල ලෙස භික්ෂූන්ට තාඩන-පීඩන කළ අතර බෞද්ධ පොත්-පත් ද විනාශ කළේය. මෙම කාලයේ දී බුදුදහම විශාල පසු බෑමකට ලක්විය.

ක්‍රි-සෙන්-ඉදෙ-සන්ගේ බුද්ධිමත්භාවය කෙතරම්දැයි දක්වුවොත් ඔහු මඤ්ජු ශ්‍රිගේ අවතාරයට සමාන කරන ලදී. මේ රජුගේ පුත් මු-මේ-සාන්-පෝ රජුගේ කාලයේ දී බුද්ධාගමට තවත් රැකුලක් ලැබුණේ ඔහු විසින් සංස්කෘත පොත්-පත් රාශියක් තිබ්බතීය භාෂාවට පරිවර්තනය කිරීමෙනි. මොහු විසින් ක්‍රි:ව 814 දී ප්‍රථම ටිබෙට් ශබ්දකෝෂය වූ

මහා ව්‍යුප්පත්තිය සම්පාදන කරන ලදී (ආනන්ද හිමි, කාන්ගහ ආරච්චි, 1963, පි. 186). ක්‍රි-සෝන්-ඉඩේ සාන් (Khri-Sron-Ide-Bstan) රජුගේ දෙවැනි පුතා රාජ්‍යත්වයට පත් විය. රජුගේ මව හා බිසවගේ ගැටුමකින් මව, රජුගෙන් පසු මරණයට පත් විය. ඉන්පසු ත්‍රිදෙසෙංග් රජු හා රැල්පචෙන් නම් රජු රජ විය. ඔහු ක්‍රි:ව 815 දී බලයට පත් විය. මොහු ඉතා ශිෂ්ට සේවයක් බුදුසමයේ උන්නතියට සිදු කලේය.

රජු ටිබෙට් උගතුන් ඉන්දියාවට යවා බුදුදහම ඉගැන්වීම, භික්ෂු සංස්ථාව නඟා සිටුවීම, ධර්ම ග්‍රන්ථ ප්‍රතිසංස්කරණය, විහාරාරාම ඉදි කිරීම, ටිබෙට් භාෂාව සංවර්ධනය, විදෙස් භාෂා බෞද්ධ පොත් ගෙන පරිවර්තනය කිරීම, ටිබේ භාෂාවට ශබ්දකෝෂයක් සකස් කිරීම, සර්වාස්තිවාදි සම්ප්‍රදායට ගරු කිරීම, බුදුදහම සරලව විවරණය කරමින් සමාන්‍ය ජනතාවට විවරණය කිරීම ආදිය වේ. දල්-බෝ-සාන් රජු හා ඔහුගේ පුත් තුම්ලායි ඛාන් රාජ්‍යයාගේ මෙහෙය ද, වජ්‍රයාන බුදු සමයේ උන්නතියට දේශීය හා විදේශීය ගිහි විද්වතුන්ගේ දායකත්වය තිදසුන්ය. එපමණක් ද නොව වර්තමානය වන විට දලයිලාමාවරුන් ද, ටිබෙට් රටේ උන්නතියට කැප වී කටයුතු කරන පිරිසකි.

දලයිලාමාවරු

දලයිලාමාවරුන් අතරින් උත්තරීතර තත්වයක් තබාගෙන ඇත්තේ 5 වන දලයිලාමාවරයාය. මෙය ටිබෙට් ඉතිහාසය නව මඟකට පෙරලන්නක් විය. ලාමාවරයාට මුළු ටිබෙටයේ ම භාරකාරත්වය පවරන ලදී. 5 වන ලාමාවරයාගේ අනුග්‍රහය ඇතිව ව්‍යාකරණ, වෛද්‍ය විද්‍යාව හා අනෙක් විෂයවලින් ලිය වූ සංස්කෘත පොත් ටිබෙට් භාෂාවට පරිවර්තනය කරන ලදී. මිනිසුන් අතර ජනප්‍රිය වූ ලාමා සම්ප්‍රදාය මහජන ශුභ සිද්ධියෙහි කෙතරම් තියැලී සිටියේ දැයි කිවහොත් ඔහුගේ මරණයෙන් පසුව ද, එම මරණය රහසක් වශයෙන් සඟවාගෙන ඔහුගේ ප්‍රධාන ඇමතිවරයා රට පාලනය කල බව දැක්වේ (ආනන්ද හිමි, 1963, පි. 187).

නිගමනය

ඕනෑම රටක් ආයතනයක් හෝ සංස්ථාවක් දියුණුවීමට ඒ සඳහා කැපවෙන පිරිසක් සිටිය යුතුම ය. එමෙන් ම, ටිබෙට්හි රාජ්‍යයෙහි

වජ්‍රයාන බුදුසමයේ උන්නතිය හෙවත් දියුණුව සඳහා කැප වූ පිරිස් ද බොහෝ වෙති. ඒ පිරිස අතර වැඩිමනක් භික්ෂූන් වූ අතර ඔවුන් භාරතයේ සිට ටිබෙටයට පැමිණි පිරිසක් වීම විශේෂතාවකි. විදේශියන් එසේ තම රටට පැමිණ තම ආගමට ගරු කරන්නේ නම්, ස්වදේශියන්ට තම රට වෙනුවෙන් ඊටත් වඩා යමක් කළ හැකිය. ඒ අනුව, ටිබෙට් රටේ උන්නතිය විෂයෙහි විදේශීය භික්ෂූන් ලබාදුන් සහයෝගය සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රාහය ලබා දුන්නේ රජවරුන් බව නිගමනය කළ හැකිය. ටිබෙට්හි භික්ෂූන්ගේ සියලු කාර්යයන්හි විෂයෙහි ඍජු දායකත්වය ලබා දී ඇත්තේ රජවරුන්ය. ශාන්ත රක්ඛිත, කමලශිල, පද්මසම්භව හා දීපංකර ශ්‍රී ඥාන යන භික්ෂූන් නොසිටින්නට අදටත් ටිබෙටයේ වජ්‍රයාන බුදුදහමක් නොතිබෙනන්ට ඇත. ටිබෙට් බුදු සමයේ උන්නතිය විෂයෙහි එරට පාලක පක්ෂය පමණක් නොව ආගමික අංශය ද බලපෑ බවත්, ඒ අනුව ටිබෙට් රටෙහි අධ්‍යාපන, ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික, ආගමික යන සියලු අංශයන්හි නිත්‍ය දියුණුව සිදු වී ඇත්තේ, ටිබෙටයේ වජ්‍රයාන බුදුසමයේ උන්නතියට දේශීය හා විදේශීය භික්ෂූන්ගෙන් ලද දායකත්වයෙන් බවත්, ඉහත පරිදි නිගමනය කළ හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ද්විතීයික මූලාශ්‍රය

ආනන්ද හිමි, වැල්ලවත්තේ., කාන්ගහ ආරච්චි, ටී.බී. (1963). සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය, තිලක ප්‍රින්ටර්ස්, පිළියන්දල.

කළුආරච්චි, අමිල. (2025). න්‍යාය ශබ්දාර්ථවාහිනී. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ධම්මදස්සි හිමි, නායිඹ්බල. (2009). ටිබෙට් බුදු සමය, ශාන්ති ප්‍රින්ටස්, පොල්ගස්ඕවිට.

නානායක්කාර, සනත්. (2000). මුල් බුදු සමයේ සිට වජ්‍රයානය දක්වා, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

නානායක්කාර, සනත්. (2003). මුල් බුදු සමයේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

බාපට්, පී. වී. (2006). දෙදහස් පන්සිය වසරක බුදු සමය, පරිඃ පත්මා ගුණසේකර, සුනෙර ප්‍රකාශකයෝ, නුගේගොඩ.

මොරටුවගම, එච්.එම්. (1996). බෞද්ධ සංස්කෘතිය හා ඉතිහාසය, රජයේ නීතිගත සංස්ථාව, පාදුක්ක.

විජයසිංහ, ඩබ්. ඒ. පී. (2004). බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය.

විමලඥාන හිමි, නාඔටුන්නේ. (2014). තාන්ත්‍රික බුදු සමය, පුබුදු ප්‍රින්ටස්, කඳාන.

සාසනරතන හිමි, මොරටුවේ. (1952). ලක්දිව මහායාන අදහස්, සී/ස පෞද්ගලික සමාගම, බොරලැස්ගමුව.

සිරි සීවලී හිමි, බඹරුන්දේ. (1948). බෞද්ධ ලෝකය, එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

Secondary Sources

Bapth, P. V. (1956). Some great Buddhist after Ashoka 2005 years of Buddhism, Governmentof India Publication, India.

Ganter, J. N. (1956). Buddhist of Kashmir & Ladakh, New delhi.

Oba, Miller. (1986), The History of Buddhism in Indian and Tibet, New Delhi.

Sechlagintweit, Emil. (1968). Buddhism in Tibet, London.

ශබ්දකෝෂ

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1998). පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මලලසේකර, ජී. පී. (2004). ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂය, සීමාසහිත එම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ 11.

විජයතුංග, හරිශ්චන්ද්‍ර. (2008). ගුණසේන මහා ශබ්ද කෝෂය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 12.

සෝරත හිමි, වැලිවිටියේ. (1999). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1970). සිංහල විශ්වකෝෂය, සංස්කෘතතික සබඳතා දෙපාර්තමේන්තුව, කොළඹ.

සඟරා (ශාස්ත්‍රීය ලිපි)

අරියවංශ හිමි, යෝධකණ්ඩියේ. (2019). තන්ත්‍රයාන බුදුදහම, බෞද්ධ නිකාය විකාශය, පනහඩුවේ සංස්: යසස්සි හිමි, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

කුසලධම්ම හිමි වැලිමඩගම, (2006), "ශ්‍රී ලාංකේය ථේරවාද බෞද්ධ සංස්කෘතියෙහි තාන්ත්‍රික අභ්‍යාසය", පාලි හා බෞද්ධ අධ්‍යානාංශයඃ කැලණිය විශ්වවිද්‍යාලය.

ධම්මදස්සි හිමි, නායිම්බල. (2014). ටිබෙට් බෞද්ධ සංස්කෘතිය, ආසියාවේ බෞද්ධ සංස්කෘතිය, සංස්ඃ පනාභඩුවේ යසස්සි හිමි සහ කේ. ඒ. වීරසේන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

සුගතරතන හිමි, කහපොළ. (2020). තන්ත්‍රයානය පිළිබඳ හැඳින්වීමක්, සංස්කෘත සාහිත්‍ය අධ්‍යයන, සංස්ඃ කහපොළ සුගතරතන හිමි, සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

Dargyay, Eva M. (1979). The rice of esoteric Buddhism in Tibet or Lamanism, Motilal Banarasidas, New Delhi.

Krishna Murti K, (1989), Buddhisam in Tibet, sandeep, New Delhi.

Waddell L Laudstin, (1996), The Buddhism in Tibet or Lamanism, Aryan Boooks International, New Delhi.